පන්හිඳේ ඕල් ස්වරූපය (අටකටු හා ලෝහ)

අනුරාධපුර ඇතුළු නුවර සල්ගහවත්ත නම් ස්ථානයෙන් හොයා ගනු ලැබූ ක්‍රිස්තු පූර්ව 600-500 අතර කාලයට අයත් වලං කැබිල්ලිල්ල සටහන්වල ඇති බ්‍රාහ්මීය අක්ෂර

කවාරත් කෙටු ගල්ලෙනක ඇති බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල් ලිපියක්

අනුරාධපුර සල්ගහවත්ත කැණීමෙන් ලැබුණු අටකටුවලින් තැබූ පුස්කොළ පොත් කම්බියා



දේවානම්පියතිස්ස මහා රජතුමාගේ මහා ලෙන පැමිණි හොපමිණි මහා සංඝයා (වහන්සේට) පූජා කිරීම ලදී යනුවෙන් සඳහන් සෙල් ලිපියක්

මිහිඳු හිමියන් වැඩමවීමටත් පෙර ලක්දිව ජනතාව ලියන්න කියන්න දැන සිටියා

අප කවුරුත් අසා ඇත්තේ, මෙරට ශ්‍රේෂ්ඨ ක්‍රමවේදී ආරම්භය සිදු වී ඇත්තේ මහින්දාගමනයෙන් පසුව බවය. එහෙත් ඊටත් පෙර සිට අප ඇතුරු ලිපු කියවූ පිරිසක් බව සහාර කරන සාක්ෂි රාශියක් මේ වනවිට සොයා ගෙන ඇත. ආචාර්ය සිරාන් දැරණියගල මහතා විසින් අනුරාධපුර මහානුවූ දාන ශාලාව අසල සිදු කරන ලද කැණීමකින් 1988 වසරේ දී හමුවූ ඇති බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කැබිලි පහක කාල නිර්ණය කිරීමෙන් පසු ඒවා ක්‍රිස්තු පූර්ව 600-500 දක්වා යුගයට අයිති බව නිරණය කර ඇත. එනම් අඩුම තරමින් මිනිදු මිණි ලංකාවට වඩාමත්ම වසර 250-350ක් අතර කාලයක් පැරැණි බවයි. මේ ඒ පිළිබඳව විද්වතකුගේ පැහැදිලි කිරීමය.

ක්‍රිපූ. 3 වැනි ශත වර්ෂයේදී ඉන්දියාවේ රජ කළ අශෝක අධිරාජයාට සම්කාලීනව ලංකාව පාලනය කළේ දේවානම්පියතිස්ස රජතුමාය. අශෝක අධිරාජයාගේ ප්‍රසාදය වන මිහිඳු මහරහතන්වහන්සේ ලංකාවට ගෙන එන බුදු දහමට හොබෝ සැලකිලිමත් රාජ්‍ය අනුග්‍රහය ලැබුණේ, ඒ නිසාම බුදු දහම ලංකාවේ මුල් බැස ගත්තේය. අනභූරුව අශෝක අධිරාජයාගෙ දියණියක වන මහින්දගේ (මිහිඳු හිමිගේ) සොයුරියක වන සංඝමිත්තා රහත් මහෙණිහිමිවහන්සේගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී මහා බෝධි ඇතුරුවක් ලංකාවට වැඩමවීය. ඒ සමග දහඅට කුලයකින රජයා පැමිණි බව මහාවංශයේ සඳහන් වේ.

ඒ අනුව ඉතිහාසය පුරා දකක ගණනාවක් තිස්සේ අප ඉගෙන ගනු ලබන්නේ මහින්දාගමනය සිදු වූ පසු ලංකාවේ සිංහල සංස්කෘතිය ඇැයිි බවයි. ලේඛන කලාව, කලා ශිල්ප, තාක්ෂණය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය හා බැඳුණු සියලුම දැනුම භාරතයෙන් පැමිණි බවයි. ඒ බව පෙළ පොතෙහි පවා සඳහන් වේ. ලංකාවේ සාහිත්‍ය කලාවේ උන්නතිය පිණිස බුදු දහමේ දැකතත්වය ගැන විවාදයක් නැත. ලංකාවේ බුදු දහමේ ඉතිහාසය විළිබඳව විස්තර කරන වල්පොල රාහුල හිමියෝ (1959) අශෝක අක්ෂර ද මිහිඳු හිමි විසින් ලංකාවට හඳුන්වා දෙන්නට ඇතැයි වැඩිදුරටත් සඳහන් කරයි. මිහිඳු හිමිගේ ආගමනය සිංහල සංස්කෘතියේ ආරම්භය වශයෙන් සැලකිය හැකියි යනුවෙන් ද උන්වහන්සේ සඳහන් කර ඇත. ලංකාවට බුදු දහම ගෙන ආවා පමණක් නොව එවකට ශ්‍රී විභූතියෙන් වැජඹුණු සංස්කෘතියක් ද ලංකාවට දායාද කළ බවත්, කලා ශිල්ප හා ගෘහ නිර්මාණ ශිල්පය ලංකාවට හඳුන්වා දෙමින් සංඝාරාම හා චෛත්‍ය නිර්මාණය කිරීමට ද මග පාදා දුන් බවත් වල්පොල රාහුල හිමියෝ සඳහන් කර ඇත. නමුත් මෙම සියලු කලා ශිල්ප ඉන්දීය ආභාසය පරාය ලාංකීය අනන්‍යතාව විදහා පායි.

මීට අමතරව විද්වතුන් රාශියක් ලංකාවේ අක්ෂර හා ලේඛන කලාවේ ආරම්භය මහින්දාගමනය සමග ඇති වූ බව සඳහන් කර ඇත. ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී භාවිත වන මහාවංශය වැනි වංශ කතා හා සෙසු සාහිත්‍යමය මූලාශ්‍ර භාවිත කරමින් මෙබඳු මතයකට එළැඹෙන්නට ඇති යැයි සිතේ.

ක්‍රිපූ. තුන්වැනි සියවසේ මැද භාගයේ දක්නට ලැබුණු පූර්ව බ්‍රාහ්මී ශිලා ලිපි ද මෙම තත්ත්වය ඇතිවන්නට හේතු විය හැකිය. සංඝයාවහන්සෙට වාසය කිරීමට සුදුසු සේ සැකැසූ ලෙන්වල ඉහළ කොටසෙන් වැසි ජලය ගලහැර පෙරී යාමට සේ කටාරමක් කොටා, කැටෑමට පහතින් ලෙන පුදා කළ උපාසක, උපාසිකාවන්ගේ වස ගෙන ද සඳහන් ලෙන් මහින්දාගමනයට පෙර දක්නට නොවූ නිසා, ලංකාවේ සියලු කලා ශිල්ප තාක්ෂණ හා ගෘහ නිර්මාණ කටයුතු නුදෙක් මහින්දාගමනයට පසුව ඇති වූ බවට නිරණය කරන්නට ඇත. එසේම 1970 වර්ෂයේ දී මෙම පූර්ව බ්‍රාහ්මී සෙල් ලිපි ප්‍රකාශයට පත් කරන මහාචාර්ය සෙනරත් පරණවිතාන මෙම සෙල් ලිපි අශෝක රජු විසින් භාවිත කළ, සාංචි භාරුත් වැනි ස්ථානවල දක්නට ලැබෙන බ්‍රාහ්මී අකුරුවලට සමාන බව දැක්වීම ද ලංකාවේ ලේඛන කලාව ඉන්දීය දායාදක් වශයෙන් සලකන්නට හේතු වන්නට ඇත.

ඉහෙත් ඉගත සඳහන් කළ පරිදි සියලු කලා ශිල්ප තාක්ෂණ ආදී කටයුතු හඳුන්වා දුන්නේ බෞද්ධාගම ලංකාවට පැමිණි පසු නම්, එක වරම ලෙන් දහස ගණනක් නික්ෂුන්වහන්සේලාගේ නිවර්සන වශයෙන් සකසා ගැනීම අතිශ ශ්‍රී ලාංකීයයන්ට මහත් අභියෝගයක් වන්නට ඇත. පරණවිහාරයන් විස්තර කරන අන්දමට ස්වභාවිකව පිහිටි ලෙනෙහි මිනිසෙකුට අත පෙවිය නොහැකි උසින් ස්වභාවික ගල්ලෙන්වල අඟල් කාලක් පමණ ගැඹුරින් කටාරමක් හාරා, ලෙන පුදා කළ තොරතුරු, කෙටීම, යකඩ තාක්ෂණයෙහි නිපුණයෙකුට මිස ලෝහ තාක්ෂණය පිළිබඳ දැනුමින් දැනුමක් පමණක්හෙකුට කළ හැක්කක් නොවේ. තාක්ෂණය ඉතා දියුණු අද වැනි දිනක පවා අතින් පාවිච්චි කරන කටු මිටවලින් නොව යන්ත්‍රාභූසාරයෙන් පවා බෙහෙ ගල් ලෙන් දහස් ගණනක කටාරම් හාරා, සෙල් ලිපි කෙටීමට එම ශිල්පයේ ආධුනිකයකු කෙසේ වෙතත් ඒ පිළිබඳ නිපුණයෙකුවත් කළ නොහැක්කකි.

දෙස් විදෙස් විද්‍යාඥයන් මිහිඳු හිමි ලංකාවට පැමිණීමට පෙර පවා, ඉතා දියුණු යකඩ තාක්ෂණයක් ලංකාවේ පැවැති බවට සාක්ෂි අතුරුගොඩ, රිදියගම, අලිගල, සමනලවැව ආදී ස්ථානවලින් තහවුරු කරගෙන ඇත. කොටින්ම ලාංකේය යකඩ තාක්ෂණය අඩු තරමින් ක්‍රිපූ. 11 තරම් ඈත අතීතයකට දිව යයි. එනම් නිල වශයෙන් ලංකාවට බෞද්ධාගම ගෙන ඒමට වසර 800කට පෙර සිට පැවැති බව, තවීන කාලනිර්ණ ක්‍රම මඟින් තහවුරු කරගෙන තිබේ. මීන් පෙනී යන්නේ සකළ කලා ශිල්ප, භාරතයෙන් පමණක් නොා ආ බවකි. ලාංකික ශිෂ්ටාචාරය නුදෙක් ඉන්දීයකරණය හොඳුවක් බවය. මීට හොඳම උදාහරණය වන්නේ ලාංකික අක්ෂර විළිබඳ බිදු කළ පෙරදිග කෙසේ ආරම්භයේ ද සඳහන් කළ පරිදි, ලංකාවේ මුල්ම සෙල් ලිපි අක්ෂර අශෝක අධිරාජයාගේ යුගයේ භාවිත කළ අක්ෂරවලට සමාන වන බැවින් හා බෞද්ධාගම ලංකාවට ගෙන ඒමට පෙර ලංකාවේ අක්ෂර කලාව පිළිබඳව සාක්ෂි කිසිවක් ලැබී නොතිබුණ බැවින්, මිහිඳු හිමියන් විසින් ලංකාවට අක්ෂර හඳුන්වා දෙන්නට ඇති බවය.

එහෙත් ආචාර්ය සිරාන් දැරණියගල විසින් අනුරාධපුර මහාපාලි දැන ශාලාව අසල සිදු කරන ලද කැණීමකින් 1988 වර්ෂයේදී හමු වී තිබෙන බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කැබිලි පහක කාල නිර්ණය කිරීමෙන්, පසු ඒවා ක්‍රිස්තු පූර්ව 600-500 දක්වා යුගයට අයිති බව නිරණය කරන ලදී. ඒ නිසා අඩුම තරමින් මිහිඳු හිමි ලංකාවට පැමිණීමට වසර 250-350ක් අතර කාලයක් පැරැණි බව ඉන් සනාථ වේ. ලොව සිළුපුන් කීර්ති ඇතැලිටින් ආඛ්‍යානය මඟින් ද මෙහි කාල නිර්ණය සිදු කර ඇත. එනිදී මෙම කරුණ වඩාත් තීව්‍රැදීව තහවුරු කරනු පිණිස යුගෙස්තෝ සංවිධානයේ මහාචාර්ය රොබින් කනින්හ් හැම මහතා විසින් මෙහෙයවන ලද ත්‍රිතානය පුරාවිද්‍යාඥයන් කණ්ඩායමක් විසින් අනුරාධපුර සල්ගහවත්ත නම් ස්ථානයේ කැණීමක් සිදු කරන ලදී. එනිදී 1988 ආචාර්ය දැරණියගල මහතා විසින් සිදු කරන ලද කැණීමේ ප්‍රතිඵල තහවුරු වූ අතර, මෙතෙක් ලංකාවේ ලේඛන කලාව මෙන්ම දකුණු ආසියාවේ බ්‍රාහ්මී අක්ෂර විළිබඳව තිබූ නිගමනයන් ද දැඩි යටිකුරු කිරීමට සමත් විය.

වර්ෂ 1988 දී හමු වූ මෙම මෙම වළං කැබිලි පහ, ලංකාවේ ඉතිහාසය පුරා ඉතා වැදගත්කමක් දරන්නේ අනුරදී වසයෙන් සඳහන් වූ වළං කුප කැබැල්ලයි. අනුරාධ නම් ඇමැතිවරයාගේ නමින් නම් කළා යැයි සැලකෙන අනුරාධපුර පුරෝ රාජධානියෙන්ම ලාංකික ශිෂ්ටාචාරයේ ඉතා වැදගත් කඩඉමක් සැකැසූ කරන පුරා වස්තුවක අනුරදී යැයි සඳහන් වීම ම කෙතරම් දෛවෝපගත සිද්ධියක් ද? මෙම බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කුප කැබැල්ලලට අමතරව ආචාර්ය සිරාන් දැරණියගලයන් විසින්ම මෙගෙයදු පුරාවිද්‍යා ඉතිහාසයේ වඩාත් වැදගත්ම කැණීමක් වන, 1969 සිදුකරන ලද, සත්ව ඇට කටුවලින් සාදන ලද අක්ෂර ලිවීමට භාවිත කළ පත්තිරිය ද අතිත ලාංකික සාක්ෂරතාවය පිළිබඳ තොරතුරු සපයයි. මීට අමතරව පාෂාණයෙන් සාදන ලද පැරණි පත්තිරිය කිහිපයක් ද නිස්සම්භාරණ ප්‍රදේශයෙන් හමු වී ඇත.

ඒ අනුව ලේඛන කලාව සම්බන්ධයෙන් ඉතා වැදගත් තොරතුරු රාශියක් මෙතිදු අනාවරණය වී ඇත. එනම් ඉගත සඳහන් කළ අනුරාධපුර සල්ගහවත්ත කැණීමෙන් ලැබී ඇති පුස්කොළ පොත්ත කම්බියට සමානව ඇටකටු හා ඇත් දන්තලින් සාද ඇති කම්බියක් යැයි සැලකිය හැකි පුරාවස්තූන් හමු වී තිබේ. මහාචාර්ය රෙජිනී කිනින්ග් හැම වෙසෙක පවිදි මෙම දිගු හතරස් හැඩයෙන් යුතු එක් කොටසක ණීලක් විද ඇත. එය පුස්කොළ පොත්ත කම්බියක් බව හඳුනාගනහොත් එය සිව් සිංහලයාගේ ලේඛන සම්ප්‍රදායන් පිළිබඳව කාල නිර්ණයන් වෙනස් මගක් ගනු නිසැකය. එසේ නම්, මෙරට පුස්කොළ පොත් ලිවීම ඇැරඹුම ක්‍රිස්තු පූර්ව සියවසේ පළගබ්ධ රාජ්‍ය සමයෙන් වඩා අතීතයට දිව යනු ඇත.

කෙසේ නමුදු ඉන්දියාවේ හා ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිතයේදී දී පැලී පෙනෙන වෙනස්කමක් ද වේ. එනම්, ඉන්දියාවේ බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි ස්වභාවයෙන්ම ශෛලද්‍ය ආගම හා බැඳී පවතින අතර, අශෝක ධර්මරාජ්‍ය විසින් කළ ප්‍රචාරණ ලිපි ද එසේ ම වේ. ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර සහිත සෙල් ලිපි, රජු මෙන්ම නායකයන්, ආඩපානීන් වෙළෙන්දන්, නාවිකයන්, උපාසක, උපාසිකාවන්, භාර්යාවන්, වෛද්‍යවරුන්, ලේඛකයන්, සිත්තරුන්, නැටුවුවන් ආදී ජනතාව මෙන්ම දිවිඩ, කාම්බෝජ වැනි ජන කාණ්ඩ සංඝයාවහන්සේලාට කළ පුදුකැන් වේ. එම නිසාම පැැරණි ලංකාවේ අක්ෂර භාවිතය කාලයක පටන් පැැලැ එන්නට ඇැයැි ද එම භාවිතය සමාජය තුළ වඩාත් හොඳින් ප්‍රචලිතව පවතින්නට ඇති බව ද පෙනී යයි. මිහිඳු හිමියන් විසින් බුදු දහම රැගෙන ආ පසු සංඝයාවහන්සේලාට සිදු කළ ලෙන් පුදා කිරීමේදී වර්ෂාවෙන් සිදුවන උපද්‍රව අවම කරැැනීමටත්, එම පුදනයන් වෙනස් කළ නොහැකි සේ පවත්වා ගැනීමට හා එමඟ ලෙන නැවත නැවත පුජා කිරීම වළක්වා ගැනීමට ලෝහ ආයුධ හා මෙවලම් උපයෝගී කරගනිමින්, කටාරම් හාරා සෙල් ලිපි කෙටීම සිරිතක් කරගන්නට ඇත. මෙයින් පෙනී යන්නේ අක්ෂර භාවිත කිරීම පිළිබඳ අවබෝධයක් පැැරණි ලාංකීය සමාජයේ විවිධ ප්‍රදේශ ඔස්සේ ව්‍යාප්තව පැැැති බවයි. එය නුදෙක් ආගමික නායකයන්ට හා පාලකයන්ට පමණක් සීමා වී නොතිබුණු බව ද පෙනී යයි.

ඊට අමතරවාගේ බොහෝ දෙනෙකු තොරතුරු සෙවීම සඳහා භාවිත කරන විකිපීඩියා වැනි දත්ත සමුදායක සඳහන් වන්නේ බ්‍රාහ්මී අක්ෂර යනු, ක්‍රිපූ. 3 වැනි සියවස වනවිට දකුණු ආසියාවේ ව්‍යාප්ති ලේඛන ක්‍රමය සඳහා භාවිත වූ නම බවයි. එහෙත් අනුරාධපුර මහා පාලි දැන ශාලාව අසල සිදු කළ කැණීමකින් ලැබුණු තොරතුරුවලට අනුව ඉතිහාසය වෙනස් වී තිබීය යුතුය. එහෙත් එසේ සිදු වූයේ නැත. ආචාර්ය සිරාන් දැරණියගල මෙම පරීක්ෂණයේ තොරතුරු පළ කරන්නේ 1990 වසරේ දී වුවත් එය පිළිගැනීමට අකාමැත්තක් දක්වන විද්වතුන් ද නැතුවාම නොවේ, එහෙත් අශෝක බ්‍රාහ්මී අක්ෂර ක්‍රිපූ. තුන්වන සියවසේ ලංකාවේ ලේඛන කලාව ආරම්භයට තුඩු දුන් බව, පෙර පිළිගත් ඉන්දීය පුරාවිද්‍යාඥයින් හා අභිලේඛන විද්‍යාඥයින් මෙම පරීක්ෂණයේ ඉහිරුද නීතා හමා පිළිගනියි.

ඉන්දියාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිතයට, වසර සිය ගණනකට පෙර ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිත වී තිබීම ගැන පුළුම වීය යුතු නැත. කෙසේ වෙතත් ලංකාවේ හා ඉන්දියාවේ භාවිත වූ බ්‍රාහ්මී අක්ෂර බොහෝ සේ සමානය. එහෙත් ඒවා ප්‍රාථමයෙන්ම භාවිත වී ඇත්තේ වසර ගණනාවක පරතරය ඇතුවය. අප මෙතෙක් සිතා සිටි බුදු දහම, නිල වශයෙන් ලංකාවට ගෙන ඒමේදී, බ්‍රාහ්මී අක්ෂර ද පැමිණි අතර, ඒ නිසා ලංකාවේ ලේඛන කලාව ඇැරඹී බවය. ඉතා කරුණු නිසා එය තවදුරටත් සනාථ කළ හැකි බව පෙනී යයි. රේඛාව වැැඟෙන් කරුණ වන්නේ, එසේ නම් ලංකාවට අක්ෂර කලාව හඳුන්වා දුන්නේ කවුරුන් ද යන්නයි. එය විජය කුමරු හා පිරිස විසින් ගෙන එන ලද බව සම්මතයන්ගේ මතය වුවත්, ඔහුට පෙර ලංකාවට පැැමිණි ලේඛකයන් ඇති බව ද කවුන් මතයකි. බ්‍රාහ්මී අක්ෂර කලාව ලංකාවේ ඇති වී, ඉන්දියාවට සාමුමණය වූ බවට ද අදහසක් ද පවතී. ඒ නිසා අභිලේඛනඥයන් හට මේවට විසඳුම් ලබාදීමට සිදු වෙනු ඇත. මෙතිදී සඳහන් කළ යුතු වඩාත් වැදගත් කරුණක් වන්නේ සිංහල භාෂාව වඩාත් සම්ප වන්නේ, දකුණු ඉන්දියාව භාවිත කරන දවිඩ භාෂාවට වඩා, උතුරු ඉන්දීය, ඉන්දු යුරෝපීය පවුලේ භාෂාවට වීමය.

මේ නිසා, 1988 අනුරාධපුර කැණීමෙන් ලැබුණු සාධක, නැති නම් ඒ බ්‍රාහ්මීය අක්ෂර ප්‍රභවයේ සුලමුල සෙවීම, අභිලේඛනඥයන්, ඉතිහාසඥයන්, පුරාවිද්‍යාඥයන් ඇතුළු විද්වතුන්ට හාර වන අතර ඒය සොයා බැැලීම ඔදුන්ගේ ද වගකීමක් වනු ඇත.

සටහන - සිසිර කුමාර බණ්ඩාර

ජේරාදෙණිය සරසවියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රස්තුතඥයාධිකත ආචාර්ය **කාංචනා දසනිගම**

බ්‍රාහ්මී අක්ෂර ලංකාවේ ලේඛන කලාව ආරම්භයට තුඩු දුන්නා



බෝ මළුවේ සුදු වැලි අතුරන්නයි
බෝ සම්බුදුන්ගේ පිහිට ලැබෙන්නයි!

ලොව පුරා බෞද්ධ සැදැහැවතුන්ගේ අපමණ වන්දනාමානයෙන් පූජනීයත්වයට පත්,
අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් වැඩසිටින පරිශුද්ධ අවට,
උඩ මළුවේ සහ පහත මළුවේ සුදු වැලි ඇතිරීමේ මහා පුණ්‍යෝත්සවය
2021ක් වූ මැයි මස 08 වන දින උදෑසන, ලංකා බැංකුවේ සැදැහැවත් අනුග්‍රාහකත්වයෙන් සිදුකළ වගයි.

බැති සිත් පෙරදැරි මෙම පුණ්‍ය කර්මයේ අනුභසින් ලොවෙහි වසංගත උවදුරු දුරුවේවා!

1975 BOC CALL CENTRE www.boc.lk

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් රැකි